# 2024-11-25 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **2025 වර්ෂයේ ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා රජයේ කාර්යයන් සහ ණය සේවාකරණය අඛණ්ඩව කරගෙන යාම සඳහා අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

2024-11-21 දින අභිනව පාර්ලිමේන්තුව රැස් වූ නමුත්, 2025 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අදාළව ව්‍යවස්ථාපිතව නියම වී ඇති පියවරයන් අනුගමනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොපවතී. එබැවින්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 23(1) අනුවගන්තියෙහි දක්වා ඇති පරිදි 2025 වර්ෂයේ මුල් මාස 04ක කාලසීමාව සඳහා දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සහ රාජ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මුදල් වෙන් කිරීම සඳහා අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව, රජයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්, රාජ්‍ය ණය සේවාකරණ සහ ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ වියදම් ද ඇතුළුව 2025 වර්ෂයේ මුල් මාස 04ක කාලය සඳහා අතුරු සම්මත ගිණුමක් සකස් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **පාර්ලිමේන්තුව වෙත පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම**

2024 වර්ෂයේ ඉදිරි කාලය තුළ ඇතැම් අත්‍යවශ්‍ය වියදම් දැරීම හා ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තුවක් මගින් සලසා ගත යුතුව ඇත. ඒ අනුව, හඳුනාගනු ලැබ ඇති ඇතැම් වියදම් 2024 අනුමත වියදම් ඇස්තමේන්තු සීමාව තුළ ප්‍රතිපාදන ගැලපීම් මගින් සිදු කිරීමට හැකියාව පවතින අතර, 2024 වර්ෂය සඳහා වන විසර්ජන පනත මගින් අනුමත සමස්ත වියදම් සීමාවන් ඉක්මවා නොයන පරිදි සහ රජයේ උපරිම ණය ගැනීමේ සීමාවට බලපෑමක් නොවන පරිදි අදාළ ගැලපීම් සිදු කිරීමට හැකියාව පවතී. ඒ අනුව, පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් රුපියල් මිලියන 219,373ක් සඳහා වන පරිපූරක ඇස්තමේන්තුවක් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

(i) ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට මාරු කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් බැංකු වෙත ලබා දීමට නියමිත පොලී සහනාධාර ගෙවීම පිණිස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 130,000ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(ii) ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් වීම හේතුවෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නමින් ඇති ඩොලර් ගිණුම්වල පවතින ශේෂය මත ඇති වී ඇති විනිමය අලාභය ගිණුම් ගත කිරීම පිණිස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 18,000ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(iii) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂිත පොලී අනුපාතික ලබා දීමේදී බැංකු විසින් දරන ලද අමතර පොලී ගෙවීම් ප්‍රතිපූරණය කිරීම පිණිස සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 32,641ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(iv) චීන රජයේ ප්‍රදානයක් ලෙස ලබා දුන් පාසල් නිල ඇඳුම් රෙදිවල වටිනාකම ගිණුම්ගත කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 9,829ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(v) ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී ඇති ගුවන් යානා 02ක වටිනාකම ගිණුම්ගත කිරීම සහ බදු ගෙවීම පිණිස ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත රුපියල් මිලියන 8,331ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(vi) වැඩි කරන ලද විශ්‍රාමික දීමනා ගෙවීම පිණිස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 1,400ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(vii) ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළව මූල්‍ය/නීති උපදේශකයින් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ගෙවීම් ප්‍රතිපූරණය කිරීම පිණිස මුදල් අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 3,213ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(viii) චීන රජයේ ප්‍රදානයක් ලෙස උතුරු හා නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණ ධීවරයින් සඳහා සහන සැලසීමට ලැබී ඇති හදිසි ආධාර ගිණුම්ගත කිරීම පිණිස ධීවර

අමාත්‍යාංශය වෙත අතිරේක ප්‍රතිපාදන සලසා දීම පිණිස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 1,533ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(ix) ජපන් රජයේ ප්‍රදානයක් ලෙස සෞඛ්‍ය අංශයේ අවශ්‍යතා සඳහා ලැබී ඇති ඉන්ධන තොගවල වටිනාකම ගිණුම්ගත කිරීම හා රුපියල් මිලියන 5,225.5ක හිඟ බදු ගෙවීම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත අතිරේක ප්‍රතිපාදන සලසා දීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 10,826ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(x) පාසල් පෝෂණ වැඩසටහන සඳහා එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් දෛනිකව දැරිය යුතු මුදල රුපියල් 85/- සිට රුපියල් 110/- දක්වා වැඩි කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අතිරේක ප්‍රතිපාදන සලසා දීම සඳහා ජාතික අයවැය දෙපාර්කමේන්තුව වෙත රුපියල් මිලියන 1,800ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(xi) ස්වභාවික ආපදා හේතුවෙන් හානියට පත් වූ දේපළ ප්‍රතිසංස්කරණය සඳහා වන්දි ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත අතිරේක ප්‍රතිපාදන සලසා දීම පිණිස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 400ක ප්‍රතිපාදන සලසා ගැනීම.

(xii) බන්ධනාගාර දෙපාර්තමෙන්තුවේ බන්ධනාගාරවල රැඳවියන් වැඩිවීම සහ ආහාර මිල ඉහළ යාම හේතුවෙන් ආහාරපාන සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ යාම නිසා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා දීම පිණිස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 1,400ක ප්‍රතිපාදන සලසා ගැනීම.

**03. දේශීය වෙළෙඳපොළේ නාඩු සහල් හිඟය සහ සහල් මිල පාලනය කිරීම පිණිස සහල් ආනයනය කිරීම**

දේශීය වෙළෙඳපොළ තුළ සහල් මිල ඉහළ යාමේ ප්‍රවණතාව සහ දැනට පවතින නාඩු සහල් හිඟය සැලකිල්ලට ගෙන, ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා සහ කම්කරු ඇමතිතුමා සමඟ එක්ව අදාළ පාර්ශ්වයන් විමසමින් අමාත්‍ය මණ්ඩලය

වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලෙස පසුගිය අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව, ඉදිරිපත් කරන ලද නිර්දේශ සැලකිල්ලට ගෙන, තැම්බූ නාඩු සහල් වර්ගයට සමාන සහල් (ස්වර්ණ) වර්ගයෙන් සහල් මෙට්‍රික්ටොන් 70,000ක් වහාම ආනයනය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

04. **ඩීසල් (0.05% M.S.) නැව් තොග 04ක් මිල දී ගැනීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

2024-12-15 සිට 2025-06-14 දක්වා කාලය තුළ ඩීසල් (0.05% M.S.) නැව් තොග 04ක් මිල දී ගැනීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබේ. ඒ අනුව, ලංසුකරුවන් 06 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර ඇත. එකී ලංසු ඇගයීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි අදාළ ප්‍රසම්පාදනය සිංගප්පූරුවේ බීබී එනර්ජි (ඒෂියා) ප්‍රයිවට් ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **2025 වර්ෂය සඳහා වන අයවැය සකස් කිරීම**

මහජනතාව විසින් රජය කෙරෙහි තබා ඇති විශ්වාසය තහවුරු වන පරිදි හා මහජනතාවගේ බලාපොරොත්තු ඉටු වන පරිදි අපේක්ෂිත සංවර්ධනයේ ආරම්භක පියවර තබන අයවැයක් වශයෙන් 2025 වර්ෂය වෙනුවෙන් අයවැය සකස් කිරීම සඳහා නව රජය විසින් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් දක්වා ඇති වියදම් සීමාවන්ට යටත්ව සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව අමාත්‍යාංශ විෂය පථයන් යටතේ ඒ ඒ අමාත්‍යාංශ විසින් හඳුනාගනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමට හැකි වන පරිදි සියලුම අමාත්‍යාංශ වෙතින් යෝජනා ලබා ගැනීමටත්, 2025 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත 2025-01-09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර දෙවන වර කියවීම (අයවැය කථාව) 2025-02-17 දින සිදු කිරීමටත්, තෙවන වර කියවීමේ අයවැය විවාදය 2025-02-27 දින සිට 2025-03-21 දින දක්වා පැවැත්වීමටත් හැකි වන අයුරින් 2025 වර්ෂය සඳහා වන අයවැය සකස් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024 සහ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 වන වගන්තිය ප්‍රකාරව පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරනු ලබන අතර, පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම පිණිස මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ ආඥාවක් ප්‍රසිද්ධ කර සති තුනක් ඇතුළත රටේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම් විසින් මහජනතාවට ඉදිරිපත් කළ යුතුය. එකී වාර්තාව 2024-10-14 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපායෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය සසඳමින් ආණ්ඩුවේ වසර මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගනු ලබන තොරතුරු ඇතුළත් වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව අදාළ වසරේ ඔක්තෝබර් මස අවසන් දින හෝ අදාළ වසරේ විසර්ජන පනත සම්මත කර මාස 10ක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේදී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාව 2024-10-31 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇත. ඒ අනුව, පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024 සහ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024 පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කරනු ලබන රජයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය - 2024 තුන්වන කාර්තුව**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 53(1) වගන්තිය අනුව, අවම වශයෙන් කාර්තුමය පදනමක් මත මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් රජයේ ආදායම් සහ වියදම් ඇතුළු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයක් කාර්තුව අවසන් වී දින 45කට නොඅඩු කාලයක් තුළදී

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කොට අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කිරීමෙන් අනතුරුව, මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කළ යුතුය. ඒ අනුව, 2024-09-30 දිනෙන් අවසන් වන තුන්වන කාර්තුව සඳහා සියලුම විශේෂ වියදම් ඒකක, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වාර්තා කරන ලද සමුච්චිත ආදායම් සහ වියදම් ඇතුළත් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

08. **ස්වෛරී ණය තිරසාරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීම**

2024 ජූනි මාසයේදී ශ්‍රී ලංකා රජය විසින් ප්‍රධාන ද්විපාර්ශ්වික ණය දෙන්නන්ගේ නිල ණය දීමේ කමිටුවේ (OCC) සාමාජිකයින් සමඟ ණය ප්‍රතිව්‍යුහගතකිරීම පිළිබඳ අවසන් එකඟතාවකට පැමිණෙන ලදී. 2024 සැප්තැම්බර් මාසයේදී ප්‍රතිපත්තිමය වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 14.2ක පමණ ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගතකිරීම පිළිබඳව ජාත්‍යන්තර ආයෝජකයින්ගේ නියෝජිත කණ්ඩායමක් වන ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් (AdHoc Bond Holders) තත්කාර්ය කණ්ඩායමක් සහ ශ්‍රී ලංකාවේ දේශීය බැඳුම්කර හිමියන්ගේ එකමුතුව (Local Consortium of Sri Lanka) සමඟ පවත්වන ලද සම්මුති සාකච්ඡාවන්ගෙන් අනතුරුව, අන්තර්ජාතික බැඳුම්කර හිමියන් සමඟ මූලික වශයෙන් එකඟතාවකට පැමිණෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය සංයුතිය, ආයෝජකයින් සහ පියවීම් සම්බන්ධයෙන් කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කරනු ලබන බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා රජයේ මූල්‍ය හා නීති උපදේශකයින් විසින් සිදු කරන ලද විශ්ලේෂණයකින් අනතුරුව සහ ශ්‍රී ලංකාව සඳහා වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන විධිවිධාන පරිදි එම අරමුදල විසින් සිදු කරනු ලබන ණය තිරසර විශ්ලේෂණය මඟින් පෙන්වා දෙන ලද පරාමිතීන්ට අනුව, දැනට පවතින බැඳුම්කර සඳහා නව බැඳුම්කර හුවමාරු කිරීමේ මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණය සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********